# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2091/7 - 2018 ඔක්තෝබර් මස 01 වැනි සඳුදා - 2018.10.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* මතු/ඉඅ/4/1564.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිපැන්න ගමේ පිහිටි කළුතර මැනුම් අධිකාරි විසින් 2018.08.31 වැනි දින මැන පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුර අංක 69හි සඳහන් හෙක්. 0.0519ක් පමණ වූ ඉඩම් කැබැල්ල.

ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩම/පරවශතාවේ විස්තරය:

01. **කැබලි අංක 1037**

ඉඩමේ නම: පිඹුරවත්ත, දිප්පිටවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන අය: අරුමප්පෙරුම ආරච්චිගේ මාලා, අංක 399/7, සමගි මාවත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0519.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 නොවැම්බර් මස 14 වැනි දින පෙ. ව. 10.00 ට මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2018 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ශ්‍යාමා පී. කාරියවසම්,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම කොට්ඨාසය.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-442

## ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* KOT/LND/ACQVI/01/49.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය:* LND/05/2003/VEP/484.

උක්ත ශීර්ෂය යටතේ අංක 2087/80 හා 2018.09.07 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද දැන්වීමෙහි සඳහන් "ලේඛන භාර දිය යුතු දිනය **2018.10.08** ලෙස හා හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය **2018.10.15**" ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2018 සැප්තැම්බර් මස 26 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කොටපොල

10-443

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.